ලංකාවිත්ති
LANKA VITHTHI

LANKA VITHTHI
P. O. BOX 64678
LONDON NW3 9LS
ENGLAND


*Phone* : 02074289388
*Fax* : 08719005163
*E-mail* : lanka.viththi @ virgin.net

කර්තෘ : දයා ආනන්ද රණසිංහ
*Editor* : Daya Ananda Ranasinghe

චිත්‍ර : චන්දන සෙනෙවිරත්න
*Art* : Chandana Seneviratna

පරිගණක කටයුතු : චන්න කබ්රාල්
*Computer Graphics* : Channa Cabraal

ඡායාරූප : ආනන්ද කාරියවසම්
*Photography* : Ananda Kariyawasam



## නමට පමණක් පොසොන්

**වෙ**සක් ලොව සියළු බෞද්ධයින්ට පොදු දව සකි. නත්තල් දිනය ලොව පුරා වෙසෙන කිතු බැතියනට විශේෂ වන නිසා එම දිනය කිතු දහම පවතින හැම රටකම සමරණවාක් මෙන් වෙසක් දිනය ද බෞද්ධයින් වෙසෙන සෑම රටකම පාහේ අගැයෙන දිනයකි. එහෙත් පොසොන් දිනය වැදගත්වන්නේ ශ්‍රී ලංකාවට පමණය. වෙන රටවලට අයට නොවේ.

දඹදිව හෙවත් බුදුන්වහන්සේ උපන් දේශය වන ඉන්දියාවේ සිට යාබද ශ්‍රීලංකාව නම් රටට බුද්ධ ධර්මය රැගෙන ආවේ ඉන්දියාවේ එකල අග්‍රාජයාණන් වන ධර්මාශෝකයන්ගේ පැවිදි පුත්‍ර මහින්ද මහරහතන් වහන්සේ ය. මහින්ද යන්න හෙළ බසට මිහිඳු නම් වේ.

මිහිඳු මහ රහතන්වහන්සේ ශ්‍රී ලංකාවට වැඩම කළේ බුදුහාමුදුරුවන් පිරිනිවන් පා අවුරුදු 236 කට පසුව ය. මේ අවුරුද්දට උන්වහන්සේගේ පැමිණීමෙන් අවුරුදු 2319 ක් සම්පූර්ණ වෙයි. එයින් කියන්නේ ශ්‍රී ලංකාව බුදුදහම වැළඳගෙන, බෞද්ධ රටක් බවට හැරී එපමණ කාලයක් වන බවයි. මෙය කිසි-සේත් සුළුපටු කාලයක් නොවේ.

මිහිඳු හාමුදුරුවන් ලංකාවට ආ දවසේ එහි රජකළ දෙවනපෑතිස් රජු මුව දඩයමේ ගොස් සිටියේය. මිහින්තලා වනයේ මුවෙකු පසුපස හඹා යද්දී "තිස්ස තිස්ස නවතින්න" යයි කියා රජු නතරකොට සතුන් මැරීමේ ආදී නව කියාදී මින්පසු සත්ව හිංසා නොකරණ ලෙසට පොරොන්දු කරවාගෙන රජු තිසරණ යෙහි පිහිටුවා බෞද්ධයෙකු බවට හැරවූ අයුරු ලංකා ඉතිහාසයෙහි සඳහන් වේ. ඒ තනි සිදු-වීම කළ බලපෑම අති විශාලය. ඉන්පසු රටේ මුළු ජනතාවම බෝද්ධයෝ වූහ.

බුදු දහමේ මූලික හරය අවිහිංසාවයි. විමුක්තිය යන මගෙහි මූලික ම පියවර වන පන්සිල් රැකීමෙහිදී එම සිල්පද පහේ මුලටම ඇත්තේ "මම ප්‍රාණඝාතය හෙවත් කිසිදු පණ නැසීමක් නොකරමි" යන අගනා පොරොන්දු-වයි. එහෙත් ශ්‍රී ලංකාව තුළ අද දවසේ ඒ පොරොන්දුව ඉටුවෙනවා ද? රැකෙනවා ද?

හලාවත මුන්නේස්වරම් කෝවිලේ වාර්ෂි-කව එළුවන් සිය ගණනක් කාටත් පෙනෙන්ට බෙලිකපා මරණ මහා බිලිපූජාවකි. ගවයන්ගේ බෙලිකපා මරණ මුස්ලිම් මස්කඩ රටපුරා ඇත. අනුරාධපුරයේ රුවන්වැලි සෑය පෙනෙන මාන යේ මත්පැන් කඩ විවෘතකරගෙන යයි. අද ලොකුම ප්‍රශ්නය බෞද්ධයින් සුරාවෙන් මුදාගන් නට නොහැකිවීමයි. දුරාචාරය ඉහවහා ගොස් ඇත. බාල තරුණ මැදි වියේ පමණක් නොව මහළු කාන්තාවන්ට පවා ලිංගික අතවරකම් කෙරෙති. හොරකමේ, වංචාවේ, දූෂණයේ සහ අසත්‍යයේ සීමාවක් නොවේ. ශ්‍රීලංකාවේ එදත් අදත් පහළ වූ කිසිදු රජයකට බෞද්ධ චත්-පිළිවෙත් ආරක්ෂාවන ආකාරයේ නීති පණවා ජනතාව හරිමගට ගන්නට හැකිවී නැත. ඒවා ඉදිරියේද ඉටුවේයයි සිතන්නට බැරි ය.

එදා මිහිඳු හාමුදුරුවන් ලංකාවට නැවිත් ඒ අනගි බුදුදහම ද රැගෙන වෙන රටකට-ඕනෑම රටකට - වැඩියේ නම් ඒ රට අද ලොව අවංකවම බෞද්ධ ප්‍රතිපත්ති රකින මිනිසුන් සිටින රටක් බවට සැකයක් නැත.



# නොකැළඹුණු ඒ නිමල විල

**ධ**ම්මො රහදෝ බ්‍රාහ්මණ සීලතිත්ථො
අනාවිලෝ සබ්භි සතං පසත්ථො
යත්ථ හවේ වේදගුනෝ සිනාතා
අනල්ලගත්තාව තරන්ති පාරං

"මගේ ධර්මය සීලය නමැති තොටුපළෙහි තිබෙන නොකැළඹුණු විලක් වගෙයි. සත්පුරුෂයන් වහන්සේලා ඒ සදහම් විලට ප්‍රශංසා කරලයි තිබෙන්නේ. මේ සදහම් විලෙන් ස්නා-නය කළ, ආර්ය ක්‍ෂාණයේ පරතෙරට වැඩි උතුමන් වහන්සේලා තෙත් නොවූ සිරුරු ඇතිව ඒකාන්තයෙන්ම නිවන් පරතෙරට වඩිනවා."

බුදුරජාණන් වහන්සේ දේශනා කළ මේ සුන්දර ගාථා ධර්මය ඇතුළත්වෙලා තිබෙන්නෙ සංයුක්ත නිකායේ සගාථ වර්ගයටයි. මෙහි ගැබ්වී ඇති කාරණාව ඉතා වටිනවා.

අපේ කය හෙවත් ශරීරය අපිරිසිදු වුනාම අපි කවුරුත් වතුර භාවිතා කරලා ශරීරය පිරිසිදු කර ගන්නවා. කය නිතර අපිරිසිදු වෙනවා වගේම අපේ සිත කියන දෙයත් ඉතා දීර්ඝ කාලයක් තිස්සේ අතිශයින් අපිරිසිදු භාවයට පත්වෙලා තිබෙන දෙයක්. කෙලෙස් කහට වලින්, කෙලෙස් දූවිලි වලින්, කෙලෙස් මලකඩ වලින්, කාම මඩවලින්, ද්වේශය කියන පිළීවලින් අපේ සිත ඉතාම අපිරිසිදුවෙලා නිතරම දුගඳ හම හමායි තිබෙන්නේ. ඉතින් ඒ විදියට ජරාවෙලා තියන සිත් පිරිසිදු කරගන්නට ජලය අවශ්‍යයි. සාමාන්‍ය වතුරෙන් කය පිරිසිදු වුනත් සිත ඒ ආකාරයෙන් වතුරෙන් පිරිසිදු කරගන් නට බැහැ. ඒ සඳහා තමයි ආර්ය අෂ්ඨාංගික මාර්ගය නමැති නිර්මල ජලය අවශ්‍ය වෙන්නෙ.

ඒ නිමල සුනිමල සිසිල් ජලය පිරී පවතින්නේ සද්ධර්මය නමැති ඉතා අසිරිමත් ගම්භීර විල තුළයි. යම් කෙනෙක් ඒ විලට බැස ගත්තොත් තමන්ගේ සිතෙහි පවතින සියළු කෙලෙස් මල සෝදා පිරිසිදු කරගන්නට ඒ කෙනා භාග්‍යවන්ත වෙනවා.

ඒ අමා සදහම් විල සත්පුරුෂයන් වහන්සේලා විසින් අප්‍රමාණ ලෙස වර්ණනා කරන ලද එකක්. එය කිසිම විදියකින් නොකැළඹුණ, නොකැළඹෙන විලක්. ඒ විලට බසින්නට තිබෙන්නේ සීලය නමැති සුන්දර තොටුපලෙන්. ඉතින් යම් කෙනෙක් සීලයට පැමිණ නැත්නම් ඒ කියන්නෙ ඔහු හෝ ඇය ඒ සදහම් විලේ තොටුපල ට වත් පා තබලා නැහැ කියන එකයි.

සීලය නමැති තොටුපලෙන් සදහම් විලට බසින භාග්‍යවන්තයින් ආර්ය මාර්ගය කියන ජලයෙන් තමන්ගේ කෙලෙස් සෝදාගන්නවා. එවිට ඒ කෙනා ආර්ය සත්‍යය කියන මාර්ගයේ පරතෙරට යන්න පටන්ගන්නවා. යම් මෙහොතක ආර්ය සත්‍ය ක්‍ෂාණයෙහි පරතෙරටම ගොස් තමන්ගේ සිතෙහි ඇති සියළු කෙලෙස් මල පිරිසිදු කරගත් විට ඒ මොහොතෙම ඒ උත්තමයන් වහන්සේ පරම පවිත්‍ර සිතකින් යුතුව මේ කෙලෙස් දූවිල්ලෙන් වැසීගත් මෙතෙරට යළි කිසිදා නොඑන ලෙසින්ම නිවන් පරතෙරට වඩිනවා.

ඒ වගේම මේ සදහම් විල තුළ සිදුකරන ස්නානයෙහි එක්තරා සුවිශේෂත්වයක් තිබෙනවා.

සාමාන්‍ය ස්නානයකදී ශරීරය තෙත්වීම සිදු වෙනවා. නමුත් මේ ස්නානයේදී එසේ වෙන්නේ නැහැ. ඒ උතුමන් වහන්සේ කෙලෙස් කසට බිඳුවක්වක් ඉතිරි නොවන තෙක් ඒ සදහම් විලේ කිමිදි කිමිදී ස්නානය කළ පසු ඒ ධර්මයට පවා තිබෙන ඇල්ම ඒ සිතින් දුරුවී යනවා. නෙළුම් කොළයක දිය බිඳක්වත් නෙතැවරෙනවා වගේ ලෝකයේ කිසිවක ඒ උතුමන් වහන්සේගේ නිකෙලෙස් සිත තැවරෙන්නේ නැහැ. ඇලෙන්නේ ගැලෙන්නේ නැහැ. සියල්ලෙන් නිදහස් වී යනවා.

ඉතින් ඒ නිසා ඒ පරම පාරිශුද්ධිය අත්කර ගත හැකි උතුම් වූ සදහම් විලට අපිත් හැකි ඉක්මනින් බැසගන්නට බලමු. අඩුම තරමින් යම් කෙනෙකුට ආපසු හැරී නොයන පරිදි සීල තොටුපල දක්වා වත් යන්නට හැකිවුනොත් නිර්මල අමා සදහම් විලේ කිමිදී ස්නානය කිරීමේ වාසනාව ඔහුට යම් කලෙක අනිවාර්යයෙන්ම උදාවේවි.

ඒ සඳහා අප හැමටද භාග්‍ය උදාවේවා. එය එසේම වේවා!

සාධු! සාධු! සාධු!

♦ පූජ්‍ය නාවලපිටියේ අරියවංශ ස්වාමීන්වහන්සේ විසිනි

## ✻ නව සහශ්‍රයට ධර්මානුශාසනා ✻

### හිතොපදේශයෙන්

**නොදයාය විනාසාය - බහුනායකතා ධ්‍රැවම්
නොනම්සයන්ති විනසයන්ති -පද්මානයර්කෙස්තු සප්තහි:**

***අර්ථය*** : *බොහෝ දෙනෙකුගේ නායක බව අත්‍යර්ථයෙන් වැඩට නොවන්නේය. විනාශය පිණිසම වන්නේය. ඉරවල් හතකින් නෙළුම් මල් ප්‍රබෝධ නොවී විනාශවන්නාක් මෙනි.*

බොහෝ ආයතන සමිති සමාගම් ආදියෙහි කඩාවැටීම් හෝ විනාශවීම් වලට බලපාන සාධක අතරින් ප්‍රධාන සාධකය ලෙස මෙම පද්‍යයෙන් පැහැදිලි කරන බහු නායකත්වය බලපාන බව පෙන්වාදිය හැකිය. එකම ආයතනයකට, සමිති සමාගමකට දක්‍ෂ බුද්ධිමත් ප්‍රබල එක චරිතයක් ප්‍රමාණවත් වන්නාක් සේම එවැන්නක නායකයින් වැඩිවීම එහි විනාශය පිණිසම වන්නේය. ප්‍රධානියා අත්තනෝමතික තීරණයක් නොගෙන අන් අයගේ සිතැහි පරිදි තීරණ ගැනීම දෙපිරිසේ ම අභිවෘද්ධිය පිණිස වේ.

බොහෝ අය තුළ තිබෙන මානසික දුර්වලතාවක් වන්නේ බලය නිලතල ආදිය ලබාගත් පසු එය රැකගැනීම සඳහා නොපණත්කම් කරන අතර, බලය නැති අය එය ලබාගැනීම සඳහා අකටයුතු කම් කිරීමයි.

නායකයින් බහුලවීමෙන් සිදුවන්නේ එකිනෙකාට වෙනස් වූ විරුද්ධ මත දැරීමෙන් ඉන් එකකුදු ක්‍රියාත්මක කිරීමට නොහැකිවීමයි. ආයතන සමිති සමාගම් ආදිය කෙසේ වෙතත් දෙදෙනෙකු අතර වුවද එකිනෙකාට විරුද්ධ මත දැරීමෙන් ගැටුම් ඇතිවීම ස්වාභාවිකයි. හැමදෙනාටම සතුට සැනසීම ගෙන දෙන ගෙදර මෙයට හොඳම නිදසුනකි. අඹු සැමියන් අතර, දෙමාපිය දූ දරුවන් අතර, තවත් විටක දරුවන් දරුව-න් අතර නොහොඳ නෝක්කාඩු වලින් පටන්ගන්නා ගැටුම් අඬදබර වලින් පෝෂණය වී, දික්කසාද ආදියෙන් හෝ ඇතැම් විට මරණයෙන්ද කෙළවර විය හැකිය. එවන් නිවසක සතුට සැනසුමට ඉඩක් නැත.

ඇතැම් නායකයින්ගේ ස්වභාවය නම් තමන් නිවැරදියයි ගෙන එම සාවද්‍ය දෘෂ්ටියේම එල්බගෙන සිටීමයි. එවන් එකෙකු නොව බොහෝ දෙනෙකු සිටියොත් එහි ප්‍රතිඵලය මහා විනාශයක් වීම නොවැලැක්විය හැකිය. බෞද්ධ සාහිත්‍යයේ එන අන්ධයින් පිරිසක් අලියා අවබෝධ කරගැනීමේ උපමාව මෙයට කදිම නිදසුනකි. එයට අනුව කෙනෙකු අලියා දුටුවේ කුල්ලක් ලෙසිනි. ඒ උගේ කන ඇල්ලීමෙනි. අනෙකා අලියාගේ පය අල්ලා එය වංගෙඩියක් ලෙසද, හොඬය ඇල්ලූ කෙනා අලියා මෝල් ගසක් මෙන්ද, වලිගය ඇල්ලූ අන්ධයා අලියා මුස්නයක් ලෙසද, බඩ ඇල්ලූ කෙනා ධන්‍යාගාරයක් ලෙසද සිතීය. මෙහිදී හැමෝම බැලුවේ තමාගේ අංශයෙන් පමණි. එසේ පැමිණි නිගමනය සත්‍ය නිගමනයක් නොවේ. එලෙස එවැනි සිය දෙනෙකුගේ නායකත්වය වුවද නිෂ්ඵලය. නායකයින් බහුලවීම හොඳ වුවද තීරණයකට එළඹිය නොහැකිය. බොහෝ පිරිසකගේ එකමුතුවෙන් පළකෙරෙන අදහස් අභිවෘධිය පිණිස පිහිට වුවද, පුද්ගලිකත්වය මත පදනම් වූ දෘෂ්ටීන් නිසා බොහෝ විට වාදවිවාද ඇතිවීම මෙන්ම සමගිය දෙදරා යෑමට ද හේතුවේ.

වාදයකින් දිනූ තැනැත්තා තම දෘෂ්ටිය ජයග්‍රහණය කළ නිසා අනුන්ට සිනාසෙයි. අවමන් කරයි. උඩඟු බවටද පැමිණෙයි. අහංකාරය මානය උපදවා ගනියි. පැරදුණු තැනැත්තා තමා ලබන නින්දාවෙන් කෝපයටත් ප්‍රතිමල්ලව යාගෙන් පළිගැනීමටත් ඉටාගනී. එසේම සිත්වේදනාවට පත්වේ. එනිසා වාදවිවාද පුද්ගලයන් අතර මෙන්ම නිවස තුළ සහ සමිති සමාගම් තුළ අභිවෘධියක් ඇති නොකරයි.

ආත්ම බුද්ධි සුඛං දෙති - බහු බුද්ධි මරණං භවෙ යන සංස්කෘත කියමනද මෙහිදී සිහියට ගැන්ම ප්‍රයෝජනවත්ය. ස්වකීය බුද්ධිය සැපගෙන දෙන අතර බහුතරයකගේ බුද්ධිය එකතු වූ තැන විනාශය ගෙන දෙන බව එහි අදහසයි.

ඉහත සඳහන් පද්‍යයේ බහු නායකත්වය විනාශය ගෙන දෙන බවට කදිම උපමාවක්ද ඇත. එනම් එක හිරුගේ උදාවත් සමග පිබිදෙන පියුම් වනය හිරු හතක් පැයූ කල විනාශ වී යන්නේය යනුයි.



♦ *රාජකීය පණ්ඩිත - ශාස්ත්‍රපති*
***පූජ්‍ය විල්ඹය විමලජෝති හිමි***
***ලන්ඩන් බෞද්ධ විහාරය***

## ✻ ධම්මපද ගාථා - Dhammapada Stanza ✻

Na anthalikkhe na samudda majje
Na pabbathanam vivaram pavissa
Na vijjathi so jagathippadeso
Yaththattitho muncheyya papakamma

Not in the sky, nor in mid-ocean, nor in a mountain cave, is found that place on earth where abiding, one may escape from (the consequence of) one's evil deed. (stanza 127- papa vagga)

**න අන්තලික්ඛෙ න සමුද්ද මජ්ජේ
න පබ්බතානං විවරං පවිස්ස
න විජ්ජති සො ජගතිප්පදේසෝ
යත්ථට්ඨිතො මුඤ්චෙය පාපකම්මා**



*පාපයේ විපාකයෙන් මිදීමට, සැඟවීමට යම්කිසි තැනක් තිබේද? එබඳු තැනක් අහසෙහිත් නැත. මුහුද මැදත් නැත. පර්වත විවරයන් තුළත් නැත. එබඳු බිම් පෙදෙසක් කොහිවත් නැත. (පාප වග්ග - 127 ගාථාව)*

**NORMA & Co
Associate Solicitors**

2 Queens Parade
Green Lanes, London N8 0RD
Tel. 020 8348 7772 / 07717173414

Any type of Visa Applications
Car Accidents

***Colombo Office***
Visa Applications & Any Refusals
100/6 Rosemead Place
Colombo 7
Tel. 2672432 / 0777686632